# වේදිකාවෙන් සමුගත් අසඩක්



හෙන්රි ජයසේන අසඩක් ලෙස හුණුවටය නාට්‍යයේ

**හෙ**න්රි ජයසේන නමැති අසහාය නාට්‍යවේදියා ජීවන රඟමඩලෙන් සමුගත්තේය. දශක ගණනාවක සිට ඔහුගේ නිර්මාණ එක්වරක් නොව වාර ගණනාවක් නරඹා රසවත්වූ සිතින් මෙම උතුම් කලාකරුවා ගැන සටහනක් තබන්නේ ඉතා සංවේදී සිතකිනි. රිදී තිරයේ මෙන්ම රූපවාහිනියේ ද නළුවෙකු වූ ඔහු වඩාත් ප්‍රියතාවක් දැක්වූයේ වේදිකාවටය. එම නිසාම ඔහුගේ නාට්‍ය නිර්මාණයන් ගැන යමක් ලිවීම ඔහුට දැක්විය හැකි ගෞරවයකැයි සිතමි.

ප්‍රතිභාපූර්ණ නාට්‍යකරුවෙකු වූ ඔහු සිය නිර්මාණයන් තුළින් ප්‍රේක්ෂකයන් පිනවූවා පමණක් නොව ඔවුන් උසස් කතිකාවත කටද රැගෙන යන්නට ද සමත්විය. පරිවර්තන හෝ ස්වතන්ත්‍ර නිර් මාණ හෝ වේවා රඟහලට ඔහුගේ කැපවීම අතිවිශිෂ්ඨය. එම කැපවී මත්, ඔහුටම ආවේණික වූ රහ සොබාවත් පිටපතේ සිටම නාට්‍යය නිමවා වේදිකාවට ගෙනෙන තෙක්ම නොලිහී, නොසැලී තිබීම ඔහු නාට්‍ය ක්ෂෙත්‍රයේ උසස්ම තලයට ඔසවා තැබුවාට සැක නැත. ඔහුගේ හැම නාට්‍යයක් තුළින්ම කිසියම් අත්හදා බැලීමක් වෙනසක් කරන්නට ඔහුට අවශ්‍ය විය. විවිධ නාට්‍ය ක්‍රම අනුගමනය කළ හෙන්රි ජයසේනයන් සිය නිර්මාණයන් තුළින් සමාජයට දුන්නේ වැදගත් පණිවුඩයකි.

"දෙයක් වේනම් යම්..... සුදුස් සාටම අයිති වියයුතු..." හුණුවටයේ කතාව නම් ඔහුගේ විශිෂ්ඨ පරිවර්තන නාට්‍යයෙන් ඔහු සමා-ජයට දුන් පණිවුඩයයි. සිත් ගන්නා නාටකීය භාෂා විලාශය ගීතවල පමණක් නොව දෙබස්වල ද දැකිය හැක. හුණුවටය අරඹමින් ගැයෙන මේ ගීතය ඔබට මතක ඇතුවාට සැක නැත.......

*"ඈත එක් යුගයක*
*ලෙයින් නැහැවුණු සමයක*
*කබ්කාස්කි නගරයක*
*සාපලත් නගරයයි නම්වූ*
*විසූවා යුවරාජයෙක්*
*ජෝර්ජි අබ්ෂ්විල්ලි*
*ඔහුගේ පුදුම නම විය......."*

1967 මාර්තු මස සිට 1999 පෙබ-රවාරි දක්වා පුරා වසර 32 ක් මෙම නාට්‍යය දිවයින පුරා වේදිකාගත විය. මෙම නාට්‍යයේ සාර්ථකත්වයට එයම සාක්ෂි නො-වේද? ජර්මන් ජාතික සුප්‍රකට නාට්‍යකරු බර්ටෝල් බ්‍රෙෂ්ට් ගේ **කොකේසියන් චෝක් සර්කල්** නම් නාට්‍යයේ පරිවර්තනයක් වූ **හුණුවටයේ කතාව** ඔහු ලාංකික සමාජයට හා වේදිකාවට උචිත අයුරින් ප්‍රතිනිර්මාණය කළේය. එහි කපටි විනිසුරුවකු වූ **අසඩක්** ලෙස හේන්රි ම කළ චරිත නිරූපණය වේදිකාවට පෙම්බැඳි කිසිවෙකුගේ මතකයෙන් ගිලිහී නොයන්නේ ය. වියත් යයි සම්මත මහප්‍රාණ වචන ඔහුගේ දෙබස්වල හෝ ගීතවල නොවීය. හුණුවටයේ සොල්දාදුවන් දෙදෙනාගේ ගීතය එයට කදිම නිදසුනකැයි සිතමි.

*යුද්දෙට මං ගියා*
*ගෑනි ගෙදර තියා*
*මගෙ යාළුවො මං එනතුරු*
*ගෑනි බලාගයි නිරතුරු*
*ස්වර්ගෙට ගිය කලේ*
*උන්දැ ඒවි බොලේ*
*අපොයි මගේ හා පැටියා*
*කියා හඩයි බොලේ*

ඔහු ලියූ එවැනි බොහෝ ලයාන්විත ගී ප්‍රේක්ෂකයා පිළිගත්තේ ය. රසවින්දේ ය.

**මනමේ** වැනි ශෛලිගත නාට්‍යන්ට පමණක් සීමාව තිබූ ගීත කලාව තාත්වික නාට්‍යය සඳහා මුල් වරට අත්හදා බැලුවේද ඔහුයි. **ජනේලය** නාට්‍ය තුළින් ඒ කාර්‍ය්‍යය සාර්ථකව කරගැන්මට ඔහුට හැකිවිය.

*මේ තියෙන්නෙ කන්තෝරුව*
*වැඩ අරඹන කන්තෝරුව*
*වැඩ නිමවන කන්තෝරුව*
*මහ රැජිණගෙ කන්තෝරුව*
*ලොක්කන් එනවා ඇවිල්ලා යනවා*
*ආයෙත් එනවා - ඇවිල්ලා යනවා*
*කන්තෝරුව නම් ඔහෙ නවතිනවා*

පසු කලෙක ඔහුගේ සෑම නාට්‍ය කටම පාහේ ගීත ඇතුළත් විය. නාට්‍යයේ සංගීත අංශය ගැන ද ඔහු තුළ වූයේ පුළුල් අවබෝධයකි.



මානෙල් හා හෙන්රි විවාහවූ දා

**කුවේණි** නාට්‍යය ඔහුගේ කලා ජීවිතයේ එක් සන්ධිස්ථානයක් ලෙස නම් කළ හැකිය. එම නාට්‍යය තුළින් පුරුෂාධිපත්‍ය යට යටවූ ස්ත්‍රීත්වය ගැනද මහඟු පණිවුඩ යක් ප්‍රේක්ෂක සිත්සතන් තුළ ජනිත කරන්නට ඔහු සමත්විය. එය ඔහුගේ වචන වලින් මෙසේ ය.

*දුරාතීතේ අන්ධකාරය*
*මැදින් සිට එබිකම් කරන්නී*
*එදා හෙළු කඳුළුත් රුහිරු බිඳු*
*සදා අප වෙනුවෙන් හෙලන්නී*
*සදා කාලෙට ලොව පහළ වුණු*
*සදා කාලෙම ලොව පහළ වන*
*කුවේණිය මයි එකම ගැහැණිය*
*එදා උපනත් - අද උපන්නත්*
*ඇයයි දුක් පීඩා විඳින්නී*
*ඇයයි වද හිංසා දරන්නී*
*ඇයයි අවමානය ලබන්නී*
*ඇයයි යකිණිය නම් ලබන්නී*

1963 වසරේ වේදිකා ගතවූ මෙම නාට්‍යයට රාජ්‍ය නාට්‍ය උළෙලේ සම්මාන හිමිවුනත් ඔහු එයින් පසු නාට්‍ය උළෙලට සිය නාට්‍ය ඉදිරිපත් කළේ නැත.

**මකරා** නාට්‍යයේ ඔහු මිනිස් සන්ථානයේ වෙසෙන මකරුන් පළවා හැරීමට පැමිණි ලාන්ස්ලොට් කුමරු විය. තමා විසින්ම තම සිත්වල ලැග සිටින මකරුන් විනාශ කළ යුතු බව එයින් ඔහු ප්‍රේක්ෂකයාට දුන් පණිවුඩයයි.

ඔහුගේ **තවත් උදැසනක්** නාට්‍යය ගොවි ජනගීත නාට්‍යයක් වශයෙන් හඳුන්වන ලදී. මෙහි රසාලිප්ත ගැමි වැයුම් කවි ගීත ආදියෙන් සොබා දහම සත්ව කරුණාව මෙන්ම ආදරයද සංවේදී ලෙස ඉදිරිපත් කිරීමට ඔහු සමත්විය.

1968 වසරේ තහනමට ලක්වූ අපට පුතේ මගක් නැතේ නාට්‍යයෙන් උපාධි ධාරී තරුණයෙකු ගෙල වැලලාගෙන මියයාම ගැන ඔහු ගැඹුරින් සාකච්ඡා කළේ ඇති නැති පරතරය නිසා අහිමිවන උගත් තරුණ ජීවිත ගැන මෙන්ම එයින් අසරණ බවට පත්වන දෙමාපියන්ටද මුල් තැන දෙමිනි. තම පුතුගේ මරණයෙන් මහත් සංවේගයට පත්වන මවගේ දෙබස් තුළින් ඔහු මතු කළ වේදනාව උපහාසය රැගත් මේ වචන අදත් ප්‍රේක්ෂකයන්ට අමතකව නැතැයි සිතමි.

"සුදු ඇඳගත්තු සුද්වන්තයො ආවා උඹේ මළගමට උඹ ඉන්න තිබුණේ බලන්න."

මවකගේ දරු සෙනෙහස අහස් මාළිගා නාට්‍යයෙන් ඔහු ප්‍රකාශ කළේ මේ අයුරිනි.

*අම්මේ නුඹෙ මාළිගාව*
*මං වට සැදූ මාළිගාව*
*සඳුන් සිහින මාළිගාව*
*සුන්දර මොනවද තියෙන්නෙ?*
*පුතේ මගේ මාළිගාවෙ*
*නුඹයි කිරුළ පළඳින්නේ*
*සිංහාසන මස්තකයේ*
*පුතේ නුඹයි වැඩ ඉන්නේ*

**දිරිය මව සහ ඇගේ දරුවෝ** (1972) සහ **සරන සියොත් සේ පුතුනි හඹායන** (1975) ඔහු කරළියට ගෙන ආ තවත් ප්‍රකට නාට්‍ය දෙකකි.



මානෙල් හා හෙන්රි සමග සුදාරක පුතා කුඩා කල




ගම්පෙරළියේ පියල් සහ නන්දා (හෙන්රි ජයසේන සහ පුණ්‍යා හීන්දෙනිය)

අවුරුදු පනහකටත් වැඩි කාලයක් පුරා විශිෂ්ඨ නාට්‍ය නිර්මාණය කරමින් වේදිකාව තම මහගෙදර කරගත් මෙම අග්‍රගණ්‍ය කලාකරුවාණන්ගේ වියෝ ගයෙන් ප්‍රේක්ෂක සහෘදයෝ තවම කම්පාවෙති.

1931 වසරේ ගම්පහ බැන්ඩියමුල්ල ගමේ උපත ලද හෙන්රි ජයසේන මහතා ගම්පහ ලෝරන්ස් විද්‍යාල යෙන් ද, කොළඹ නාලන්දා විදුහලෙන් ද අධ්‍යාපනය ලැබීය. ඉංග්‍රීසි ගුරුවරයෙකු ලෙස නුවරඑළිය දිස්ත්‍රික්ක යේ පදියපැලැල්ල පාසැලේ ජීවිතය ඇරඹූ ඔහු පසුව කොළඹ ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ සේවයට පත්වුණි. 1962 දී ඔහු මානෙල් ඉලංගකෝන් මෙන විය හා විවාහ වූයේ ය.

ජීවත්වූ වසර හැත්තෑ නවයක කාලයෙන් වසර හැටක් පමණ ගෙවී ගියේ නාට්‍ය කලාව මෙන්ම චිත්‍ර පට හා ටෙලි නාට්‍යයන් සමගය. ප්‍රතිභාපූර්ණ නිළි යක වූ බිරිඳ මානෙල් 2004 ජූලි මස මොලොව හැර ගියාය. හෙන්රි ජයසේන මහතා තම පුතු සුදා රකත්, ලේලිය හා මුනුබුරන්ද සමග ඉතා විවේකී ජීවිත යක් ගතකරමින් සිටියේ ය.




ආචාර්‍ය්‍ය හෙන්රි ජයසේන තමා ලියූ *Play is the thing* නම් පොත කියවමින්

පොතපත කියවූයේ ය. ලියූවේ ය.

රෝගාබාධයන්ට ගොදුරුවූ ජීවිතය මරණයට පරාජයවීම ස්වාභාවිකය. එහෙත් ඔහු කලාකරු-වෙකු ලෙස දිනාගත් ජනප්‍රසාදය හෝ කීර්තිනාමය කිසි කලෙක මරණයට දිනාගත නොහැක. ලාංකීය නාට්‍ය ක්ෂෙත්‍රය පවතිනාතුරු හෙන්රි ජයසේන නාමයද සදා ගෞරවයෙන් යුතුව සිහිපත් කෙරෙනු ඇත. එසේ වන්නේ ඔහු වැනි උතුම් කලාකරු-වන්ගේ නාමය මරණයෙන් පසුව අමරණීයත්වයට පත්වන බැවිනි.

ආචාර්‍ය්‍ය හෙන්රි ජයසේන මහත්මාට උතුම් වූ නිවන් සුව අත්වේවායි පතමු!

♦ **පද්මා කුරුප්පු** **Paris - France**